**බදුල්ල මහා නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ඔක්තෝබර් 31 දින වන විටද විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර, 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 ගණුදෙනු, මෙහෙයුම් හා කාර්යසාධනය පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

විගණනයේ දී නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 1988 අංක 56 දරන ජාතික පරිසර පනතට අනුව පාරිසරික අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කරන ලද 2000 නොවැම්බර් 22 දිනැති අංක 1159/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ "අ" උපලේඛණය | සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන ගෝඝාතකාගාරය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | අංක 371 | 1998 වර්ෂයේ සිට 2013 දක්වා කාලය තුල අවස්ථා 42 කදී විවිධ කාර්යයන් සඳහා විවිධ පාර්ශවයන් වෙත දෙන ලද අත්තිකාරම් රු.3,499,415 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදය 1:6 හා 4 වගන්ති | සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ලැබූ, සේවය හැර ගිය හා වැඩ තහනමට ලක්වූ සේවකයින් 26 දෙනෙකු ගෙන් වසර 05 – 14 දක්වා කාලයක සිට අය නොවී පවතින සේවක ණය රු.1,580,510 ක් අයකර ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් පරිපාලනය

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව 2013 ජනවාරි 01 ට පැවති වරිපනම් බදු හිඟයෙන් අයකිරීම් 24% අගයක පමණ වූ අතර, 2013 වර්ෂයේ බිල්කළ මුදලින් අයකිරීම් 49% ක් පමණ පහල මට්ටමක පැවතිනි. අනෙකුත් ආදායම් විෂයයන් යටතේ ද 2013 ජනවාරි 01 දිනට පැවති හිඟයෙන් අයකිරීම 62% ට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

2.1.1 **වරිපනම් බදු**

-------------

(අ) මහා නගර සභා ආඥා පනතේ 237(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව යම් ගොඩනැගිල්ලක හෝ ඉඩමක වාර්ෂික වටිනාකමට බලපාන පරිදි එහි භෞතික වෙනස්කම් සිදුකරන ලද අවස්ථාවක ඒ ස්ථානය සඳහා අලුත් තක්සේරුවක් සිදුකර ඒ මත වරිපනම් බදු අයකළ යුතු වුවද, 2013 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුල නිකුත් කරන ලද අනුකූලතා සහතික 20 කට අදාලව ඉදිකරන ලද නව ගොඩනැගිලි වටිනාකම මත වරිපනම් බදු අය නොකර 2002 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන පැරණි දේපොල වටිනාකම මත වරිපනම් බදු අයකර තිබුණි.

(ආ) සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති වරිපනම් බදු මුදල රු.36,322,029 ක් වූ අතර මහා නගර සභා ආඥා පනතේ 252(1) (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර එම හිඟය අයකරගෙන නොතිබුණි.

2.1.2 **ඉඩම් බදුදීම**

-------------

(අ) සභාව සතු බදුල්ල කෝපියාවත්ත පාරේ පිහිටි පර්චස් 04.5 ක ඉඩමක් විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව 1994 වර්ෂයේ දී රු.5,600 ක වාර්ෂික බදු මුදලකට බදුල්ල දිස්ත්‍රික් සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සංගමය වෙත බදු දී තිබුණි. සභා තීරණයක් මත 1995 වර්ෂයේ සිට සංශෝධනය කිරීමකින් තොරව රු.1,500 ක මාසික කුලියක් 2013 වනතෙක්ම බිල්කරමින් පැවති අතර 2013 දෙසැම්බර් 31 වන විට මාස 181 කට අදාලව ලැබිය යුතු හිඟ කුලී රු.310,162 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) සභාව සතු බදුල්ල සයිමන් පීරිස් ශාලාවේ කොටසක් නාගරික සංවර්ධන අධිකාරියේ ඌව පළාත් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා 2000 ජනවාරි සිට වසර 15 ක කාලයක් සඳහා බදු දී තිබූ අතර, 2013 මැයි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාල හිඟ කුලී රු.322,750 ක් අයකරගෙන නොතිබුණි.

(ඇ) බදුල්ල මධ්‍යම බස් නැවතුම්පල "සී" ගොඩනැගිල්ලේ 57 කොටස 2000 සැප්තැම්බර් 19 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත වසර 50 කට බදු දී තිබූ අතර එම බදු ගිවිසුමේ 06 වගන්තිය ප්‍රකාරව සභාව වෙත වරිපනම් බදු අයකර ගෙන නොතිබුණි. එම ගිවිසුමේ 10 වගන්තිය ප්‍රකාරව 2012 ඔක්තෝබර් මාසයේ දී නාගරික කොමසාරිස්ගේ අනුමැතිය මත ගොඩනැගිල්ල වෙනත් පාර්ශවයකට ලබාදී තිබූ අතර නව බදුකරු සමඟ ගිවිසුමකට එළඹීමට හා වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සතු ගොඩනැගිල්ලක් විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව 1986 වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා රු.3,500 ක මාසික බදු මුදලකට බදු දී තිබූ අතර, 2014 මාර්තු දක්වාම එම කුලිය සංශෝධනය කර නොතිබුණි.

(ඉ) සභාව සතු පර්චස් 20 ක ඉඩමක් 1987 වර්ෂයේ දී ගිවිසුමක් මත ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත බදු දී තිබුනද, අදාල බදු ගිවිසුමේ බදු කාලය අවසන් වන දිනය සඳහන් කර නොතිබුණි. 1987 වර්ෂයේ අයකළ රු.3,600 ක වාර්ෂික බදු කුලිය සංශෝධනය කිරීමකින් තොරව 2014 වර්ෂය දක්වාම අයකෙරෙමින් පැවතිනි.

(ඊ) බදුල්ල මධ්‍යම බස් නැවතුම්පලේ පිහිටි අංක 48-සී දරන කාමරය විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව පෞද්ගලික බස් සමාගම වෙත බදු දී තිබූ අතර, 2013 වර්ෂයට අදාල රු.132,848 ක් වූ හිඟ කුලී අයකරගෙන නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**ආර්ථික නොවූ ගණුදෙනු**

--------------------------

සභාව විසින් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් බදු පදනම මත ලබාගත් දේපල වෙනුවෙන් එම දේපල පිහිටි ස්ථාන, ඒවායේ වර්ග ප්‍රමාණයන් හඳුනාගැනීමකින් තොරව 2011 සිට 2013 පෙබරවාරි දක්වා කාලය තුල රු.1,399,752 ක් බදු කුලී ලෙස ගෙවා තිබුණි. එම බදු කුලී ගෙවන ඇතැම් දේපල පෞද්ගලික පාර්ශවයන් විසින් අනවසර ඉදිකිරීම් කර පරිහරණය කරන බව 2013 අගෝස්තු 05 දින කරන ලද භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

4. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය